# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2016

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම

(Business Law and Ethics)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 20ක වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 10 කින් යුක්ත විය.

අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. ප්‍රශ්නයට වෙන්කර තිබූ මුළු ලකුණු වලින් 60% ක් පමණ අයදුම්කරුවන් උපයාගෙන තිබුණි. සමස්ථයක් වශයෙන් අයදුම්කරුවන්ගෙන් උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.

අංක 1.5 සහ 1.7 පහසු ප්‍රශ්න වුවද, බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්න වලට උත්තර ලිවීමට අපොහොසත් වූ බව පෙනී ගියේය. අතීතානුයෝගීව ඇතිවන නියෝජ්‍යත්ව සම්බන්ධතාව හඳුනා ගැනීමට ප්‍රශ්න අංක 1.5 න් අවශ්‍ය වූ අතර, අංක (2) අපරානුමතිය මත නිවැරදි උත්තරය වෙනුවට, අංක (3) අවශ්‍යතාවය මත යන වැරදි උත්තරය බොහෝ අයදුම්කරුවන් විසින් ලියා තිබුණි. ප්‍රශ්න අංක 1.7 සඳහා ද, ජාත්‍යන්තර වෙළදාමේදී යොදා ගනු **තොලබත** ගෙවීම් ක්‍රමය සඳහා අංක (4) අත්තිකාරම් ගෙවීම යන වැරදි උත්තරය, අංක (2) මුදල් ඇණවුම යන නිවැරදි උත්තරය වෙනුවට සපයා තිබුණේය. තවද, අංක 1.8 ප්‍රශ්නයට උත්තර සැපයීමේදී අදාල නොවන නොයෙකුත් උත්තර ලියා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා ශ්‍රී ලංකාවේ තිබෙන නියාමන ආයතන දෙකක් සඳහන් කිරීමට නොහැකි වී ඇත. A **කොටස** සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට සම්පූර්ණ විෂය නිර්දේශය පිළිබඳ සමස්ථ දැනුමක් අයදුම්කරුවන් ලබා තිබිය යුතුය.

## B කොටස

### ප්‍රශ්න අංක 02

ප්‍රතිබන්ධනය (Estoppel) මත නියෝජ්‍යත්වය ඇති කිරීමට සම්බන්ධ නියෝජ්‍යත්ව නීතිය යටතේ මෙම ප්‍රශ්නය යොදා තිබේ. අයදුම්කරුවන් බොහොමයකට ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර ගැනීමට නොහැකි වී ඇත. දී තිබූ කෙටි සිදුවීම් පෙළ මත අයදුම්කරුවන්ගෙන් සුළු ගණනක් නිවැරදිව නීතිය හඳුනාගෙන තිබුණි. ප්‍රතිබන්ධනය මත නියෝජ්‍යත්වය ඇති වී ඇති බව හඳුනාගත් නමුත් ඒ ගැන නිවැරදි පැහැදිලි කිරීම් ලිවීමට ඔවුන්ට හැකිවී නැත. ලකුණු අඩුවෙන් ලබාගත් අයදුම්කරුවන්ට එසේ වී ඇත්තේ කරුණු කිපයක් සඳහන් කිරීමත්, වෙනස් නියෝජ්‍යත්ව නීති මත පදනම් වූ අදාල නොවන කරුණු ලිවීම නිසාත්ය.

සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

### ප්‍රශ්න අංක 03

අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබේ. නැව තෙක් නොමිලේ (FOB) සහ පිරිවැය, රක්ෂණය සහ ගැල් කුලිය (CIF) ගිවිසුම් අතර වෙනස්කම් පැහැදිලි කිරීම පිළිබඳ ප්‍රශ්නයකි. සමහර අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා තිබූ අතර සමහරු අඩුවෙන් ලකුණු ලබා ඇත. අඩු ලකුණු ලැබීමට හේතුව කරුණු කිපයක්ද අදාල නොවන ඇද ලියා තිබීමයි. FOB සහ CIF දෙකේ වෙනස විස්තර කළ යුතු වුවද සමහරු එම ගිවිසුම් දෙක විස්තර කර තිබෙනු දක්නට ලැබුණි. සමස්ථයක් ලෙස වෙන්කළ ලකුණු වලින් 60% ක් පමණ ප්‍රශ්නය සඳහා ඔවුන් උපයාගෙන තිබේ.
මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය තරමක් සතුටුදායක බව කිව හැකිය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය වූයේ වෙක්පත් රේඛන වර්ග දෙකක් සඳහන් කිරීම සහ ඒවායේ නෛතික බලපෑම් විස්තර කිරීමය. උත්තර වලින් දැකිය හැකි වූ පොදු වරද වූයේ රේඛන වර්ග සඳහන් කිරීම පමණක් තිබීම හා ඒවායේ නෛතික බලපෑම පිළිබඳ අවධාරණය නොකිරීමයි.

අයදුම්කරුවන් බොහොමයක් ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. සමහරු සම්පූර්ණ ලකුණු ද සමහරු අඩු ලකුණු ද ලබා තිබුණි. අඩු ලකුණු ලැබීමට හේතුව අදාල නොවන කරුණු ලියා තිබීමය. වෙන් කළ මුළු ලකුණු වලින් 60% ක් පමණ ඔවුන් ලබා තිබුණි.

මුළුමනින් ම ගත් කල අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය සේවා නියුක්තිය අවසන් කිරීම මත පදනම් වී තිබුණි. සමහර අයදුම්කරුවන් හොඳින් ලකුණු ලබා ඇත. සමහරු අඩු ලකුණු ලබා තිබේ. (b) කොටසට උත්තර ලෙස සේවකයන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැහැර කරන සේවක වර්ග දෙක සටහන් කිරීමට ඔවුන් අපොහොසත් විය. මෙම පනතට අනුකූල නොවී සාමාන්‍ය දැනුම මත උත්තර ඔවුන් සපයා ඇත.

සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නොවේ. ප්‍රශ්නයට වෙන් කළ ලකුණු වලින් 40% සිට 50% දක්වා ඔවුන් උපයා ඇත.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය වූයේ ගණකාධිකාරීවරයෙකුට මුහුණපෑමට සිදුවන ආචාරධර්ම ගැටළු 5 ක් සඳහන් කිරීමය. උත්තර වලින් පෙනී ගියේ අයදුම්කරුවන්ගේ බහුතරය මෙම විෂය පථය ගැන හොඳින් දන්නා බවය. සමහර අයදුම්කරුවන් ගැටළු "සඳහන් කිරීම" ට පමණක් ප්‍රශ්නයේ නියම කර තිබූ නමුත් අනවශ්‍ය ලෙස සවිස්තරාත්මක පැහැදිලි කිරීම් සඳහා කාලය මිඩංගු කර තිබුණේය.

සමස්ථයක් වශයෙන් ගත් කල ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

<u>C කොටස</u>

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය හවුල් ව්‍යාපාර නීතිය මත පදනම් වූ අතර අයදුම්කරුවන් බොහොමයක් හොඳන් උත්තර ලියා තිබුණි. ප්‍රශ්නයට වෙන්කළ ලකුණු වලින් 70% / 80% ක් පමණ උපයාගෙන තිබේ. ප්‍රශ්නයේ දී තිබෙන සිදුවීම් පෙළ හා සම්බන්ධ නොකොට හවුල්කරුවන් ඉපැයූ ලාභය බෙදාගැනීමේ වගකීම ගැන පමණක් සමහර අයදුම්කරුවන් ලියා තිබුණි. දී තිබෙන සිදුවීම් පෙළ හා සම්බන්ධ නෛතික පසුබිම සමග සම්බන්ධ කරමින් අවසාන නිගමන දැක්වීම මෙම වර්ගයේ ප්‍රශ්න වලදී අතිශයින් වැදගත්ය.

ප්‍රශ්නයේ (b) කොටසේ අධිකරණයේ මැදිහත් වීමෙන් විසුරුවා හැරීම ගැන නිශ්චිතව සඳහන්ව තිබියදීත්, අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමේ සාමාන්‍ය අවස්ථා ගැන වැරදි උත්තර ලියා තිබුණේය. ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීම අතිශයින් අවශ්‍යය.

සමස්ථයක් වශයෙන් ගත්කල උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

## ප්‍රශ්න අංක 08

රක්ෂණ නීතිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය යොදා තිබුණේය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය (a) කොටසින් විමසා තිබූ රක්ෂණ වර්ග පැහැදිලි කරමින් ද (b) කොටසින් විමසා තිබූ රක්ෂණ සංකල්ප පිළිබඳව ද නිවැරදි උත්තර ලියා තිබුණි. සුළු පිරිසක් පමණක් ප්‍රශ්නයට උත්තර ලිවීමේදී වැරදි කර තිබුණේය.

රක්ෂණ සමාගම් දෙකෙන්ම රු.300,000/- බැගින් ඉල්ලා සිටීම ට සුනිල් ට හිමිකම් තිබේ ද නැද්ද යන්න ගැන පැහැදිලි උත්තරයක් දී කරුණු දක්වා රක්ෂණ නීතිය අනුව සාධාරණීය නොකල අවස්ථා කිපයක්ද දක්නට ලැබුණි.

සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.

## ප්‍රශ්න අංක 09

මුදල් විශුද්ධිකරණය යන්නෙහි අර්ථය පැහැදිලි කිරීම ද 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ පනතට අනුව නීතිවිරෝධී ක්‍රියාකාරකම් 5 ක් දැක්වීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී. මෙම ක්ෂෙත්‍රය ගැන සමහර සමහර අයදුම්කරුවන් දැනුවත් නැති බවද, මහ බැංකුවෙන් මුදල් නැවත මුද්‍රණය කිරීම, මුදල් භෞතික ලෙස අපවිත්‍ර වූ විට හා පාට විකෘති වූ විට පිරිසිඳු කිරීම වැනි කිසිසේත්ම අදාල නොවන වැරදි උත්තර ලියා ඇති බවද නිරීක්ෂණය විය. මෙය සරල ප්‍රශ්නයක් වුවද අයදුම්කරුවන්ගෙන් බහුතරය වෙත් කළ මුළු ලකුණු වලින් 60% ක් පමණක් උපයා ගැනීමට සමත්විය. ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

සමස්ථයක් වශයෙන් ගත්කල උත්තර ලිවීමේ කාර්යසාධනය තරමක් සතුටුදායකය.

<u>D කොටස</u>

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය.

(a) කොටසින් අපේක්ෂා කර ඇත්තේ ගිවිසුම් නීතිය මත පදනම්ව, දී ඇති සිදුවීම් පෙළට යොමු වෙමින්, රසිත්ගෙන් ත්‍යාගය ඉල්ලා සිටීමට නිශාදි ට හිමිකමක් තිබේදැයි විමසා බැලීමය. ගිවිසුම් නීතියේ ඇතුලත් අර්පණය (offer) සහ ප්‍රතිග්‍රහණය (acceptance) පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අදහස් කර ඇත. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට හොඳින් උත්තර ලියා ඇත. ගිවිසුම් නීතියට යොමු නොවී ප්‍රශ්නයේ දී තිබූ කරුණුම උත්තරය ලෙස ලියූ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙක් ද වූහ. නිශාදි අර්පණය ගැන නොදැන බවත් අර්පණය ඇයට සන්නිවේදනය වී තිබූ නැති බවත් සමහර අයදුම්කරුවන් නොසලකා හැර ඇත.

සමස්ථයක් වශයෙන් මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

(b) කොටසෙන් අවශ්‍යව ඇත්තේ ලෙස්ලි විකුණූ භාණ්ඩවල අයිතිය ඔහුට (ලෙස්ලි) ට නොතිබියදී ලෙස්ලිගෙන් රු.60,000/- ක් අයකර ගැනීමට සමන්ට හිමිකමක් තිබේදැයි විමසා බැලීමය. මෙය භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යාංග කොන්දේසි (implied conditions) වලට අදාල වන්නකි. දී ඇති සිදුවීම් පෙළ අනුව විකුණුම්කරුට විකිණීමේ හිමිකමක් නොමැත්තේ නම් ගැනුම්කරු සාවද්‍ය අපහසු තත්ත්වයට පත්වන බව හඳුනාගැනීමට අයදුම්කරුවන් බහුතරයකට හැකි වී නැත. මෙම ප්‍රශ්නයට ඉතාමත් දුර්වල අන්දමින් අයදුම්කරුවන්ගෙන් බහුතරය උත්තර සපයා තිබේ. බොහෝ තැන්වල අදාල නොවන කරුණු ඔවුන් දක්වා ඇති අතර තවත් සමහර තැන්වල ප්‍රශ්නයේ දී ඇති තොරතුරු ඒ අයුරින්ම ලියා ඇත. ඒ අනුව මෙම කොටසට ඉතා අඩු ලකුණු ලබා තිබේ.

සමස්ථයක් වශයෙන් බලනකල, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අසාර්ථක උත්තර සපයා ඇත්තේ මෙම ප්‍රශ්නයේදී බව කිව හැකිය.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්නය තුළ භාවිත කර ඇති **කළ යුතු ක්‍රියාව** තුළින් බලාපොරොත්තු වන පිළිතුර ක්‍රියා නිර්වචනයට අනුකූල වන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

4. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -